**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.31 පැය 1310 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/182/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**බැඩ්මින්ටන් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

නැගෙනහිර පළාත් බැඩ්මින්ටන් සංගමය මඟින් සංවිධානය කරනු ලැබූ විවෘත බැඩ්මින්ටන් ශූරතාවලිය 2025.01.23 වන දින සිට 2025.01.27 වන දින දක්වා මඩකලපුව වෙබර් ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

මෙම තරඟාවලියට දිවයින පුරා විවෘත ,කේවල,යුගල,මිශ්‍ර යුගල සහ වයස් කාණ්ඩ යටතේ ක්‍රීඩා කණ්ඩායම් 35 ක් යටතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 350 ක් පමණ සහභාගි විය.

මෙම බැඩ්මින්ටන් ශූරතාවලිය සඳහා ශ්‍රී ලංකා පොලිසිය නියොජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් සහභාගි වී ඇති අතර එහිදී පොලිස් කොස්තාපල් 12555 ගීත් නිලධාරියා විසින් වයස අවුරුදු 35න් ඉහළ කේවල තරඟ ඉසව්වට සහභාගි වී අනුශූරතාවය දිනා ගැනීමට සමත් විය.

බැඩ්මින්ටන් කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ටී.සී. ධනපාල මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙනිය මහතා කටයුතු කරයි. කළමණාකරු ලෙස පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.එම්. වික්‍රමනායක මහතා සහ පුහුණුකරු ලෙස උප පොලිස් පරීක්ෂක මධුක දුලංජන යන නිලධාරීන් කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**